**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2022**

----------------------------------------------------------------------------------------------------

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එලඹි අංක.9186-එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතුයයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන සහ ව්‍යාපෘති ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු පලාතේ යාපනය ප්‍රදේශයේ කුඩා හුදකලා දූපත් 03 (නයනතිව්, අනලතිව් හා එළුවතිව්) තුල වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා ඵලදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. බාහිරව මුදල් යෙදවීමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර වූ ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන එම මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නොසැසඳුනු ශේෂයන්

| විස්තරය | මුදල රු.මි | නොසැසඳුනු කාල සීමාව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයට අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම රුපියල් මිලියන 229.06 ක් වූ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශනයේ එය රුපියල් මිලියන 283.25 ක් ලෙස සඳහන් කර ඇත. ඒ අනුව ඉහත මූල්‍ය ප්‍රකාශන දෙක අතර රුපියල් මිලියන 54.19 ක නොසැසඳුනු ශේෂයක් පැවතුනි. | 54.19 | අවුරුදු 01 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය අංශයේ මගපෙන්වීම මත ව්‍යාපෘතිය විසින්, මේ වන විට 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කෙරීගෙන යන වැඩවල වියදම්වලට අදාලව සම්පූර්ණ සහ සවිස්තරාත්මක සැසඳුම් ලේඛනයක් සකස් කරමින් පවතී | වෙනස්කම් හඳුනා ගැනීම සඳහා සැසඳුම් ලේඛනයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම.

| | නීති රීති සහ රෙගුලාසි වෙත යොමු කිරීම | අනුකූල නොවීම/විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තිය. | මෙහෙයුම් කමිටු රැස්වීම මාස 02කට වරක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය ආරම්භයේ සිට කිසිදු රැස්වීමක් පවත්වා නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සංවිධානය කිරීමේ වගකීම ක්‍රියාත්මක කරන ආයතනයට පවරා ඇති බැවින් මෙය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් තොර කටයුත්තක් වේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 128(1) ඉ, අංක 507, අංක 756 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රථම සෑම වසරකම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ යුතුය, කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ භාණ්ඩ සමීක්ෂණය 2023 මාර්තු 31 දින දක්වා සිදු කර නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් භාණ්ඩ සමීක්ෂණය පවත්වනු ලබන අතර මෙම වසර අවසානයේ වාර්තාව ඉදිරිපත් කරනු ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4 : 6 | අධ්‍යානයේ හෝ අභ්‍යාසයේ වියදම සම්පූර්ණ වශයෙන් හෝ අඩ වශයෙන් හෝ දරනු ලබන්නේ ශ්‍රී ලංකාණ්ඩුව විසින්ද, නැතහොත් විදේශ ආණ්ඩුවක් | සේවකයින් සම්බන්ධයෙන් වන විදේශ පුහුණුවීම් වලට අදාල රෙගුලාසි | නීති, රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත |

| | | | |
|---|---|---|---|
| | නොහොත් ඒජන්සියක් විසින්ද යන්න නොසලකා හැම අවස්ථාවකදීම යටකී පරිදි ගිවිසුමක් හා / හෝ බැදුම්කරයක් ලියා අත්සන්කරවා ගැනීම අවශ්‍ය වන නමුත් ව්‍යාපෘති ප්‍රදානය යටතේ රු.8,341,355 ක් වැයකර ඇමරිකා එක්සත් ජනපදයේ පැවති ප්‍රතිආශ්‍රිත පිරියත ඒකකයට අදාල විශේෂඥයින් පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා සහභාගීවී තිබූ මණ්ඩලීය නිලධාරීන් වෙතින් උක්ත විධිවිධානයන්ට අනුව ගිවිසුමක් හෝ බැදුම්කරයක් අත්සන් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුගමනය කිරීමට යුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතියේ සංරචකය | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | දිනකට ඝණ මීටර් 150 ක මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත සහ ඒ ආශ්‍රිත සිවිල් කටයුතු සැපයීම හා ස්ථාපනය කිරීම. | 2021 ඔක්තෝබර් 21 දිනට මෙම ක්‍රියාකාරකමේ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර භාරදී තිබුනද, එතැන් සිට දිනකට ආසන්න වශයෙන් ජලය ඝණ මීටර් 70 ක් පමණ නිපදවනු ලැබේ. දූපත් තුනෙහි ජීවත් වන පවුල් 1662 ක ඉලක්කයක් අතරින් ජල සම්බන්ධතා 204 ක් පමණක් ලබා දී ඇත. ඒ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය ප්‍රතිලාභීන් වෙත ලැබී නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පාලනය කල නොහැකි රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස් වීම හේතුවෙන් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන කාර්යය ප්‍රගතියක් ලබා නොමැත. | ප්‍රතිලාභීන්ගේ අරමුණු ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිනකට ටොන් 2 ක අයිස් සෑදීමේ කර්මාන්ත ශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම. | ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් බලශක්ති පද්ධති ව්‍යාපෘතියෙන් විදුලිය ලබා නොදීම හේතුවෙන් ටෙන්ඩර් කැඳවීම අත්හිටුවා ඇත. මේ නිසා මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අයිස් කර්මාන්ත ශාලාවෙන් මේ දූපත් තුනේ ධීවර ප්‍රජාවට ලබාදීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභ අහිමි වී තිබිණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් බලශක්ති පද්ධතිය නොමැතිකම හේතුවෙන් අයිස් කැට නිපදවන බලාගාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් තොර වේ. | විදේශ ආධාර උපරිම ලෙස භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත ඒකකය 2020 ජූලි සිට ආරම්භ කරන ලද අතර එහි වගකීම් කාලය 2025 ජුනි දක්වා වසර පහක් පවතී. 2023 පෙබරවාරි මාසය වන විටත් එම ඒකකය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවන බැවින් ඒකකය සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන විට ඇතිවිය හැකි අභ්‍යන්තර දෝෂ පියවා ගැනීමට වගකීම් කාලය තුළ නොහැකි වීමේ අවදානමක් පවතී. | කොන්ත්‍රාත් ලේඛනයට අනුව මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත ඒකකය සම්පූර්ණ ධාරිතාවයෙන් පරීක්ෂා කරන ලදී. වගකීම් සහතිකය මුළු බලාගාරයේ සියලුම දෝෂ ආවරණය කරනු ඇති අතර එය මෙහෙයුම් ධාරිතාව මත රඳා නොපවතී. | ඒකකය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට වහාම පියවර ගත යුතුය. |

## 3.3 ව්‍යාපෘති අරමුණුවලට පටහැනි ව සිදුවන ලද ගෙවීම්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති අරමුදල් වලින් රුපියල් මිලියන 8.3ක් වැය කරමින් මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත (SWRO) ඒකකයට අදාළ විදේශීය පුහුණු වැඩසටහනක් සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවෙකු සහ සිවිල් ඉංජිනේරුවෙකු සහභාගී වී ඇතත් ලංසු ප්‍රමාණ පත්‍රයට අනුව පුහුණුව සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවන් දෙදෙනෙකු සහභාගී විය යුතු අතර සිවිල් ඉංජිනේරුවන් ඉහත බලාගාරයට අදාළ කිසිදු රාජකාරියක් ඉටු නොකරයි. | පිළිතුර ලැබී තිබුණේ නැත | පුහුණු වැඩසටහන් සඳහා සුදුසුකම් ලත් අදාළ නිලධාරීන් තෝරා ගැනීමට හා ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව ගෙවා ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |